පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

| | | | |
|---|---|---|---|
| තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. | 517 | ෆැක්ස් / தொலைநகல் / Fax No. | 011- 2329500 |
| දුරකථනය / தொலைபேசி / Telephone | 011-2384024<br>011-2395605 | ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail | Policemedia@police.lk |
| | Website: www.police.lk | | |
| මගේ අංකය / எனது இல. / My No. | PMD / PR / 256 / 22 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2022.02.15<br>පැය 1230 | | |

# මාධ්‍ය නිවේදන

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## සැකකරුවෙකු ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීම - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

2021 වර්ෂයේ අගෝස්තු මස මුල්මැඩිය, හිනිදුම ලිපිනයේ පදිංචි පෝංගිලිය ගමගේ ශෙහාන් මාලක යන අය විසින් මාධ්‍ය හමුවක් පවත්වා පාස්කු ප්‍රහාරය සම්බන්ධව සිදු කරන ලද ප්‍රකාශ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනයක් පවත්වන ලදී. මෙම විමර්ශන අවසන් වීමෙන් පසු ඒ පිලිබඳව ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබුණි.

ඒ අනුව එම මාධ්‍ය හමුවේ සිදු කරන ලද ප්‍රකාශ මඟින් දණ්ඩ නීති සංග්‍රහයේ 120 වන වගන්තියේ සඳහන් වරදක් සිදු කර ඇති බව ගරු නීතිපතිතුමා විසින් තීරණය කර ඇති අතර, ඒ අනුව ඔහු අත්අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව ඉහත සැකකරු පානදුර ප්‍රදේශයේදී 2022.02.14 වන දින අත්අඩංගුවට ගන්නා ලදී.

සැකකරු 2022.02.15 වන අද දින මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රුපියල් 15000/- ක මුදල් ඇපයක් හා රුපියල් ලක්ෂ 05 බැගින්වූ ශරීර ඇප දෙකක් මත මුදා හැර ඇති අතර, ගුවන් ගමන් තහනම් කරමින් විදේශ ගමන් බලපත්‍රය අධිකරණයට භාරදෙන ලෙසත්, සෑම මසකම අවසන් සතියේ ඉරිදා දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙසට හා පදිංචිය තහවුරු කිරීමට ද නියෝග කර ඇත. මෙම නඩුව නැවත 2022 මාර්තු මස 29 වන දින කැඳවීමට නියමිතය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**